# PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நீதியானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

**PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS**

2016.10.26

මහින්ද දේශප්‍රිය මැතිතුමා,

සභාපති,

මැතිවරණ කොමිෂන් සභාව,

සරණ මාවත,

රාජගිරිය

ගරු සභාපති තුමනි,

**සීමා නිර්ණ ගැටළු නොමැති පළාත් පාලන ආයතන වල මැතිවරණ කඩිනමින් පැවැත්වීම.**

ශ්‍රී ලංකාවේ පළාත් පලාන ආයතන 336 ම මේ වන විට මහජන නියෝජිතයින්ගෙන් තොරව වසර 2 කට ආසන්න කාලයක් ක්‍රියාත්මක වේ. උතුරේ සමහර පළාත් පාලන ආයතන මැතිවරණ ඊටත් වැඩි කාලයක් කල් දමා ඇත. මැතිවරණය කල් දැමීමට ප්‍රධාන හේතුව ලෙස මතුව ඇත්තේ නව මැතිවරණ ක්‍රමයට අදාල සීමා නිර්ණ කටයුතු අවසන් නොවීම ලෙස සඳහන් වුවද ඒ සඳහා ගත කරන කාලය කිසි ලෙසකින්වත් සාධාරණීය කරණය කල නොහැක. එමෙන්ම එය ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය නොසලකා කටයුතු කිරීමකි.

සීමා නිර්ණ ගැටළු අවසන් කලද පනතෙහි ඇති තාක්ෂණික දෝෂ පදනම් වී නැවත වරක් මැතිවරණය කල් දැමීමේ අවදානමක්ද පවතී. එම ගැටළු විසඳීම සඳහා සාධාරණ කාල රාමුවක් තුල වැඩපිළිවෙලක් ඇති බවක්ද නොපෙනේ. කෙසේ වෙතත් මෙම ගැටළු නොසලකා ඒ ඒ පළාත් පාලන ආයතන වලට අදාල කොට්ඨාශ ප්‍රමාණය හා සභිකධූර ප්‍රමාණය ගැසට් පත්‍රයේ පලකලහොත් මැතිවරණ පැවැත්වීමට මැතිවරණ කොමිෂන් සභාව සූදානම් බව ප්‍රකාශ කිරීම අප බෙහෙවින් අගය කරමු.

සභාපති තුමනි,

අප දන්නා පරිදි පළාත් පාලන ආයතන 60 කට වැඩි ප්‍රමාණයක් පිළිබඳ කිසිදු පැමැණිල්ලක් ලැබී නොමැත. එබැවින් එම පළාත් පාලන ආයතන වල සභික ප්‍රමාණය හා කොට්ඨාශ ප්‍රමාණය ගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රථම ගැසට් පත්‍රය අනුව ගණනය කල හැකි අතර ඊට අනුරූපීව කාන්තා නියෝජනයද ගණනය කල හැකි වනු ඇත. එමෙන්ම 1998 පළාත් සභා මැතිවරණ පිළිබඳ වරුණ කරුණාතිලක මහතා පැවරූ නඩුවේ තීන්දුවේද සඳහන් වන්නේ මැතිවරණ කොමසාරිස්වරයාගේ ස්වාධීනත්වය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම ආරක්ෂා වී ඇති බැවින් කොමසාරිස්වරයා මැතිවරණයට අදාල ඕනෑම කරුණකදී නොබියව ක්‍රියා කලයුතු බවත්ය. එමෙන්ම එකී නඩු තීන්දුවට අනුව කොමසාරිස්වරයාට අවශ්‍යයැයි හැඟෙන කරුණකදී අධිකරණයේ නියමයන් විමසිය හැකි බවද පෙනී යයි.

එබැවින් අප මැතිවරණ කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින්නේ ගැටළු රහිත පළාත් පාලන ආයතන වල මැතිවරණ පැවැත්වීමට නොබියව කටයුතු කරන ලෙසත් ඒ හරහා ජනතාවට තම ප්‍රාදේශිය පාලකයා තෝරාගැනීමට ඉඩ ප්‍රස්ථාව ලබා දෙන ලෙසත්ය.

මෙයට,
විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂක

පිටපත - උනන්දුවක් දක්වන සෙසු ආයතන

# 12/3, Robert Terrace, Robert Gunawardana Mawatha, Colombo 06, Sri Lanka.
Tel : (+94) 11 2514441 / 11 2514442 Fax : (+94) 11 2514443
E-mail : paffrel@sltnet.lk Website : www.paffrel.lk